


## අප වැඩ කරන්නේ කොහේද

සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි අපි ගෝලීය වශයෙන් සේවය කරන ස්ථාන වෙනස් කරමු. දැනට රටවල් 80 කට වැඩි සංඛ්‍යාවක අපගේ කාර්යාල පිහිටුවා ඇති අතර ලෝක ව්‍යාප්ත අප කාර්ය මණ්ඩලය 11,000 ක් පමණ වෙයි.




## තවත් විස්තර සඳහා

අපගේ වෙබ් අඩවිය www.icrc.org ඔබට සමීප ICRC දූත මණ්ඩලය හෝ ඔබ රටේ රතු කුරුස හෝ රතු අඩසඳ සමාජය වෙතින් දැනගන්න.

තෝරාගත් ප්‍රකාශන සහ චිත්‍රපට නාමාවලිය අපගේ වෙබ් අඩවියෙන් හෝ පහත සඳහන් ලිපිනයට අපට ලියා ඇණවුම් කරන්න.

ICRC

International Committee of the Red Cross
19, avenue de la Paix
1202 Geneva, Switzerland
T +41 22 734 60 01   F +41 22 733 20 57
E-mail: shop@icrc.org   www.icrc.org
© ICRC, December 2009

0728/002 01.2012 30,000

Front cover: Till Mayer/ICRC



# ලොවපුරා ICRC ක්‍රියාකාරකම්

ICRC

IN BRIEF


Bo Mathisen/Verdens Gang


Boris Heger/ICRC


Guntar Prima Gotama/ICRC

## අප කවුද

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) ස්විට්සර්ලන්තයේ මූලස්ථානය පිහිටි මානුෂවාදී සංවිධානයකි. එය අන්තර් ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ (1863) ආරම්භක සාමාජිකයාය. මෙම සංවිධානය, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සමාජ සහ අන්තර් ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සමාජ සම්මේලනය යන සංවිධානවලින් සමන්විතය.

අන්තර් ජාතික ප්‍රජාව විසින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව මානුෂවාදී නීතිය බාරකරු බවට පත් කොට නීතිය ප්‍රවර්ධනය කිරීමේ බලය පවරා ඇත.

සන්නද්ධ ගැටුම්වලින් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්‍වයන් නිසා පීඩාවට පත්වන ජනතාවට ආධාර සපයමින් අපි ලොව පුරා සේවයෙහි නිරතව සිටිමු.

## අප ඉටු කරන කාර්යයන්

- එදිරිවාදිකම්වල නිරත නොවන සිවිල් ජනතාවට විය හැකි අහිතකර බලපෑම් හැකිතාක් මග හැරීම සහ ඔවුන් ආරක්ෂා කිරීම සහතික කිරීමට උත්සාහ දැරීම
- යුද සිරකරුවන් සහ ආරක්ෂක රැඳවියන් හමුවීම
- සන්නද්ධ ගැටුම නිසා වෙන්වී සිටින පවුල් සාමාජිකයන්ට පණිවුඩ යැවීම සහ ඔවුන් යළි එක් කිරීම
- අතුරුදන්වූවන් සොයා ගැනීමට උපකාර කිරීම
- මූලික සෞඛ්‍ය ආරක්ෂණ සේවා පිරිනැමීම හෝ ලබා ගැනීමට පහසුකම් සැලසීම
- ඉතා ඉක්මනින් අවශ්‍යව ඇති ආහාර, පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ නිවහන් සැපයීම
- අන්තර් ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීම ප්‍රවර්ධනය කිරීම
- අන්තර් ජාතික මානුෂවාදී නීතිය පිළිපැදීම නිරීක්ෂණය කිරීම සහ එය තවත් වැඩි දියුණු කිරීමට දායකවීම
- යුද්ධයේදී යොදා ගන්නා බෝම්බ සහ පුපුරණ ද්‍රව්‍ය වලින් ජනතාවට එල්ලවන බලපෑම අඩු කිරීමට උපකාර කිරීම
- සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්ට මුහුණදීම සඳහා සූදානම්ව සිටීමට සහ ඒවායේ දී ප්‍රතිචාර දැක්වීමට ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සමාජවලට ආධාර කිරීම

## අප වැඩ කරන ආකාරය

අපක්ෂපාතිත්වය, මධ්‍යස්ථභාවය සහ ස්වාධීනත්වය යන රතු කුරුස සහ රතු අඩසඳ මූලික ප්‍රතිපත්තිවලින් අප ඉටු කරන කාර්යයන්ට මඟ පෙන්වන අතර එමඟින් අපගේ මානුෂවාදී මෙහෙවර සපුරාලීමට හැකිවෙයි. එනම්, යුද්ධයේ සහ අභ්‍යන්තර ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත්වන අයගේ ජීවිත හා ඔවුන් සතු ගරුත්වය සුරැකීම හා ඔවුන්ට ආධාර සැපයීම. සන්නද්ධ ගැටුමෙන් විපතට පත් වී සිටින අයට ආධාර කිරීම පිණිස අප සියළු පාර්ශවවලට කථා කරමු. ප්‍රචණ්ඩ තත්වයන්හි දී පුද්ගලයන් ආරක්ෂා කරන අන්තර් ජාතික මානුෂවාදී නීතියට සහ වෙනත් මූලික රීති වලට ගරු කිරීමට අවිදරන්නන්ගේ පරිශ්‍රමවලට අපි සහාය දක්වමු.

යුද සිරකරුවන් සහ ආරක්‍ෂක රැඳවියන් හමුවීමට යන අපි ඔවුන් අතුරුදන්වීම වැලැක්වීම පිණිස ලියාපදිංචි කරමු. ස්වකීය නිදහස අහිමිව සිටි මිනිසුන්හට කාරුණිකව වෙනත් අපයෝජනවලට ඔවුන් ලක් කිරීම තහනම් කොට ඇති ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතිවලට අනුව සලකන බව සහතික කිරීම පිණිස බලධාරීන් සමඟ ක්‍රියා කරමු.